# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2012/42 - 2017 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2017.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

2016 අංක 01 දරන උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 2017 මාර්තු මස 13 වැනි දින උතුරු මැද පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

එච්. එල්. එස්. විජේසිංහ,
ලේකම්,
උතුරු මැද පළාත් සභාව.

2017 මාර්තු මස 21 වැනි දින,
උතුරු මැද පළාත් සභාවේ දී ය.

**2016 අංක 01 දරන උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තිය**

2016 අංක 01 දරන උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තිය 2016 නොවැම්බර් මස 29 වැනි දින පැවැත්වූ උතුරු මැද පළාතේ පළාත් සභා රැස්වීමේදී සම්මත වූ බව මෙයින් සහතික කරමි.

ටී. එම්. ආර්. සිරිපාල,
සභාපති,
උතුරු මැද පළාත් සභාව.

2017 පෙබරවාරි මස 16 වැනි දින.

වර්ෂ 2017 ක් වූ මාර්තු මස 13 වැනි දින මා විසින් සහතිකය සටහන් කරන ලදී.

පී. බී. දිසානායක,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

උතුරු මැද පළාත්
2016 අංක 01 දරන උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තිය

ප්‍රධාන අමාත්‍යාංශය
උතුරු මැද පළාත

1A - PG 3476 — 107 (2017/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උතුරු මැද පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තිය

මෙම ප්‍රඥප්තිය යටතේ ලොතරැයි පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කිරීම සඳහා උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩලය පිහිටුවීම පිණිස ද, එම ලොතරැයි පැවැත්වීමෙන් උත්පාදනය වන අරමුදල් පළාත් සභා අරමුදලට, ප්‍රධාන අමාත්‍ය අරමුදලට සහ උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදලට මාරු කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

01. මේ ප්‍රඥප්තිය 2016 අංක 01 දරන උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් මෙම ප්‍රඥප්තියට අනුමතය ලබාදීමෙන් පසු අමාත්‍යවරයා විසින් නියමිත දිනය වශයෙන් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත්කරනු ලබන දිනක සිට වලංගු වන්නේ ය.

අරමුණු

02. උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩල ප්‍රඥප්තියේ අරමුණු වනුයේ ලොතරැයි පැවැත්වීමට සහ එමගින් අරමුදල් උත්පාදනය කිරීමත් එම අරමුදල් පළාත් සභා අරමුදලට, ප්‍රධාන අමාත්‍ය අරමුදලට සහ උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදලට මාරු කිරීම වන්නේ ය.

### 1 වන කොටස

### උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩලය පිහිටුවීම

උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩලය පිහිටුවීම

03. (1) උතුරු මැද පළාත් ලොතරැයි මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන. (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරන) මණ්ඩලයක් මේ ප්‍රඥප්තිය කාර්ය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, මණ්ඩලය විසින් එම නාමයෙන් නඩු පැවරීමග ද, මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

මණ්ඩලයේ සංයුතිය

04. මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;
(ආ) පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;
(ඇ) ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී හෝ ඔහුගේ නියෝජිතයකු ;
(ඈ) පළාත් ආදායම් කොමසාරිස්.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පිළිගත් විශ්ව විද්‍යාලයකින් කවර හෝ ක්ෂේත්‍රයක උපාධියක් ලැබූ (මේ ප්‍රඥප්තියේ මින්මතු ''පත්කළ සාමාජිකයන්'' යනුවෙන් හඳුන්වනු ලබන) තවත් සාමාජිකයන් දෙදෙනකු.

05. යම් තැනැත්තෙක් -

සාමාජිකයකු වීම සඳහා නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් ;

(ආ) තමා විසින් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී ඒ සඳහා අගතිදායක ලෙස බලපෑමට හැකියාවක් ඇති යම් මූල්‍යමය හෝ වෙනත් බැඳීමක් තමාට හෝ තමාට සම්බන්ධතාවයක් ඇති යම් තැනැත්තකුට තිබේ නම් ;

(ඇ) සිහිවිකල තැනැත්තකු ලෙස ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ තීරණය කරනු ලැබ සිටී නම් හෝ විනිශ්චය කරනු ලැබ සිටී නම් ;

(ඈ) නිදහස් නොකළ බංකොලොත් තැනැත්තකු වේ නම් ;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනයක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තකු නම් ;

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

සාමාජිකයන්ගේ ධුර කාලය

06. (1) සිය නිලබලයෙන් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් වූ සෑම තැනැත්තකු ම ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් දැරීම ප්‍රකාරව ද ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම ඉල්ලා අස්වීම, මියයාම හෝ ධුරයෙන් ඉවත් කිරීම මගින් ධුරය හිස් කළහොත් මිස ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් සිය ධුර කාලය අවසන් වන්නේ නම් මිස නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතු ය. එසේ නැවත පත් කිරීම අනුයාත වුව ද එසේ නොවුව ද තවත් එක් ධුර කාලයකට වඩා නොවැඩි විය යුතු ය.

(3) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, අබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක එසේ නොහැකි වීම පිළිබඳව අමාත්‍යවරයාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. එවැනි අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 5 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම් සහ ඉල්ලා අස්වීම.

07. (1) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් එම ලිපිය පිළිගනු ලබන දින සිට එම ඉල්ලා අස්වීම බලාත්මක වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් හේතු දැක්වීමෙන් පසු පත් කළ සාමාජිකයකු ඉවත් කළ හැකි ය. එම ඉවත් කිරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(3) යම් පත් කළ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කරන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 5 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් නව සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා

08. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ නිලබලයෙන් සාමාජිකයන් අතුරින් යම් කෙනෙකු (මින්මතු ''සභාපතිවරයා '' ලෙස හඳුන්වනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ විධානයට සහ පාලනයට යටත්ව ඔහු මණ්ඩලයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කළ යුතු ය.

(3) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් එම ලිපිය පිළිගනු ලබන දින සිට එම ඉල්ලා අස්වීම බලාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා හේතු දැක්වීමෙන් පසුව සභාපතිවරයා එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව තුළ සභාපතිවරයා වශයෙන් ධුර දැරිය යුතු ය.

(6) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, අබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම

09. (1) මණ්ඩලයේ රැස්වීම් අවශ්‍යතාවය මත අවම වශයෙන් මාසයකට එක් වරක් හෝ පවත්වනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, එම රැස්වීම පැමිණ සිටින සාමාජිකයන් විසින් එහි මූලාසනය දැරීම සඳහා තමන් අතුරින් යම් සාමාජිකයකු තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(4) යම් රැස්වීමක දී ඡන්දවල සමානතාවක් ඇත්නම්, සභාපතිවරයා හෝ එම රැස්වීම් මූලාසනය දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(5) මණ්ඩලය විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳව එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් පැවති පමණින් අවලංගු වන සේ නොසැලකිය යුතු ය.

(7) මෙම ප්‍රඥප්තියේ 16 වන වගන්තිය යටතේ සාමාන්‍යාධිකාරීවරයා මණ්ඩලයේ ලේකම් විය යුතු ය.

(8) මණ්ඩලයේ රැස්වීම් වලට පැමිණ සිටීමේ හා ඒ රැස්වීම් වල කථා කිරීමේ හිමිකම මණ්ඩලයේ ලේකම්වරයාට තිබෙන අතර, ඒ රැස්වීම්වල ඡන්දය දීමට ඔහුට හිමිකමක් නොමැත.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

10. මණ්ඩලයේ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට හා එසේ නිශ්චය කරනු ලබන යම් අනුප්‍රමාණ මත මණ්ඩලයේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

11. (1) මණ්ඩලයේ මුද්‍රාව -

මණ්ඩලයේ මුද්‍රාව

(අ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(ආ) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කළ නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(ඇ) එහි අනුමතය ඇතිව සහ සභාපතිවරයා හා මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබීමට පරිබාහිරව විය යුතු ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය

12. (1) මණ්ඩලයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :-

(අ) උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදලට, පළාත් සභා අරමුදලට සහ ප්‍රධාන අමාත්‍ය අරමුදලට අරමුදල් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කිරීම ;

(ආ) එසේ පවත්වන ලද ලොතරැයිවලින් ලැබෙන මුදල් මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදලට, පළාත් සභා අරමුදලට, සහ ප්‍රධාන අමාත්‍ය අරමුදලට ප්‍රේෂණය කිරීම ;

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය :-

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට, හෝ කුලියට ගැනීම හෝ දීම හෝ මණ්ඩලයේ යම් චංචල හෝ නිශ්චල දේපළක් උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ؛

(ආ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන නියම හා කොන්දේසි මත ණය ලබා ගැනීම ؛

(ඇ) මුදලින් හෝ වෙනත් ආකාරයකින් වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම සහ ඒවා මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යෙදවීම ;

(ඈ) අමාත්‍යවරයා විමසා මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ සේවා නියුක්තියේ නියම හා කොන්දේසි නිශ්චය කිරීම ;

(ඉ) අමාත්‍යවරයා විමසා ඒ නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කිරීම ;

(ඊ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභය පිණිස අමාත්‍යවරයා විමසා අර්ථසාධක අරමුදල් සහ වෙනත් යෝජනා ක්‍රම පිහිටුවීම, ඒවා විධිමත් කිරීම සහ ඒ අරමුදල්වලට හෝ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ؛

(ඩ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(ඬ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් කාර්යය පටිපාටි සෑදීම ; සහ

(ණ) මණ්ඩලයේ සාමාන්‍ය කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම පහසු වනු පිණිස ඒ සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

13. මණ්ඩලය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේදී අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි යම් සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත් විය යුතු ය. *අමාත්‍යවරයා විසින් මණ්ඩලයට විධාන දිය හැකි බව*

## II වන කොටස

### මුදල් සහ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

14. (1) මණ්ඩලයට (මෙහි මින්මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේම අරමුදලක් තිබිය යුතු ය. *මණ්ඩලයේ අරමුදල*

(2) මේ ප්‍රඥප්තියෙන් ඒ අරමුදලට ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නියමිත සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලින් මුදල් ගෙවීම සඳහා වන සියලු චෙක්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරන ලද යම් නිලධරයකු විසින් අත්සන් කළ යුතු ය.

15. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. *ලිත් වර්ෂය සහ ගිණුම් විගණනය*

(2) මණ්ඩලය විසින් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් සභා අරමුදලට දෙන ලද දායක මුදල් එහි ආදායම් සහ වියදම් පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

16. (1) උතුරු මැද පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරක සේවයේ නියුතු අයෙකු ලේකම් විසින් මණ්ඩලයෙහි සාමාන්‍යාධිකාරී වශයෙන් පූර්ණ කාලීනව ද්විතීනය පදනමින් පත් කළ යුතු ය. *මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පළාත් සභා රජයේ නිලධරයන් පත් කිරීම.*

(2) මණ්ඩලයෙහි කටයුතු මෙහෙයවීම, මණ්ඩලයෙහි බලතල කාර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීමද, මණ්ඩලයේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලනය, පාලනය, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනය යටත්ව සාමාන්‍යාධිකාරී වෙත භාර විය යුතු ය.

(3) කාර්යක්ෂම ලෙස මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය සළකන නිලධාරීන් හෝ සේවකයන් මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන් අනුව මණ්ඩලය විසින් පනවන ලද කාර්ය පරිපාටීන්ට අනුකූලව පත් කිරීම සහ එකී තනතුරෙන් හෝ නිලයෙන් ඉවත් කිරීම සාමාන්‍යාධිකාරී විසින් සිදු කළ හැකිය.

(4) පළාත් සභා රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි යː නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) පළාත් සභා රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) පළාත් සභා රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයෙකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල සහ පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වෙනස් කිරීම් සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව හෝ පළාත් සභාව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් පළාත් රාජ්‍ය සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට හෝ පළාත් සභාවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

### ලොතරැයි පැවැත්වීම

මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්විය යුතු බව.

17. (1) මණ්ඩලය විසින් මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ ලොතරැයි පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම හෝ කරනු ලැබිය යුතු ය. එසේ පවත්වනු ලබන සෑම ලොතරැයියක් ම මෙහි මින් මතු උතුරු මැද පළාත් ලොතරැයියක් යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) සෑම උතුරු මැද පළාත් ලොතරැයියක් ම මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව යම් නියමිත ආකාරයට පවත්වනු ලැබිය යුතු ය.

උතුරු මැද පළාත් ලොතරැයි ත්‍යාග.

18. (1) එක් එක් උතුරු මැද පළාත් ලොතරැයියෙහි ප්‍රදානය කරනු ලබන ත්‍යාග සංඛ්‍යාව සහ ඒ එක් එක් ත්‍යාගයේ වර්ගය හා වටිනාකම මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) උතුරු මැද පලාත් ලොතරැයියක ප්‍රදානය කරනු ලබන සෑම ත්‍යාගයක් ම මෙහි සඳහන් දේවල් එකකින් හෝ වැඩි ගණනකින් සමන්විත විය හැකි ය :-

(අ) නිවසක් ;
(ආ) මෝටර් වාහනයක් ;
(ඇ) කවර හෝ විස්තරයකට අයත් යම් භාණ්ඩයක් ; හෝ
(ඈ) යම් මුදලක්.

(3) සෑම උතුරු මැද පළාත් ලොතරැයියක ම ත්‍යාගලාභීන් ප්‍රසිද්ධියේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකින් හෝ නොම්බර ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) යම් උතුරු මැද පළාත් ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව ඒ ලොතරැයියේ ඒ ත්‍යාගයට හිමිකම් ලබන තැනැත්තා සොයා ගැනීමට නොමැතිවීමේ හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කරනු ලැබ නොමැති යම් ත්‍යාගයක් පළාත් සභාව සන්තක වන්නේ ය. එම ත්‍යාගය යම් මුදල් ප්‍රමාණයක් වන අවස්ථාවක ඒ මුදල් ප්‍රමාණය හෝ ත්‍යාගය නිවසක්, මෝටර් වාහනයක් හෝ වෙනත් භාණ්ඩයක් වන්නේ නම් එය විකිණීමෙන් ලැබෙන මුදල පළමුකොට අරමුදලට ද ඉන් පසුව එය පළාත් සභා අරමුදලට ද බැර කරනු ලැබිය යුතු ය.

එසේ වුවද ඒ ත්‍යාගය හා සම්බන්ධව කරන ලද යම් හිමිකම් පෑමකින් උද්ගත වූ යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් ඉහත කී මාස හයක කාලසීමාව ඉකුත්වන විට දී යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනය වී පවතී නම් එසේ රජය සන්තක කිරීමක් නොකළ යුතු අතර, ඒ නඩුව හෝ නඩු කටයුත්ත අවසාන වශයෙන් විනිශ්චය කිරීමේ දී යම් තැනැත්තකු ඒ ත්‍යාගයට හිමිකම් ලබන බවට ප්‍රකාශ කරනු ලැබුවහොත් මණ්ඩලය විසින් ඒ තැනැත්තාට ඒ ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය. කිසිම තැනැත්තකු එසේ හිමිකම් ලබන්නේ යයි ප්‍රකාශ කරනු නොලැබුවහොත් සහ ත්‍යාගය මුදල් ප්‍රමාණයක් වන අවස්ථාවක ඒ මුදල් ප්‍රමාණය හෝ ත්‍යාගය නිවසක්, මෝටර් වාහනයක් හෝ වෙනත් යම් භාණ්ඩයක් වන අවස්ථාවක ඒ නිවස, මෝටර් වාහනය හෝ භාණ්ඩය විකිණීමෙන් ලැබෙන මුදල පළමුකොට අරමුදලට ද ඉන් පසුව එය පළාත් සභා අරමුදලට ද බැර කරනු ලැබිය යුතු ය.

උතුරු මැද පළාත් ලොතරැයි වලින් ලැබෙන මුදල

19. (1) මේ ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන සෑම උතුරු මැද පළාත් ලොතරැයියකින් ම ලැබෙන මුදල් පළමුකොට අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) සෑම උතුරු මැද පළාත් ලොතරැයියකින් ම ලැබෙන මුදල, එම මුදලින්,

(අ) මණ්ඩලය විසින් ඒ ලොතරැයියෙන් ප්‍රදානය කරන ලද ත්‍යාගවල වටිනාකම ද ඇතුළුව ඒ ලොතරැයි පැවැත්වීම සඳහා දරන ලද වියදම් පියවීමේ හෝ වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීමක් වේ නම් ඒ සම්පූර්ණ පාරිශ්‍රමික හෝ ඉන් කොටසක් සහ මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ;

(ඇ) 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ සඳහන් යම් අර්ථ සාධක අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට මණ්ඩලය විසින් ගෙවිය යුතු යම් දායක මුදලක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය සහ ;

(ඈ) මණ්ඩලයේ වෙනත් බැරකම් දැරීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල වශයෙන් පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසුව ඉතිරිවන මුදල මණ්ඩලය විසින් ප්‍රධාන අමාත්‍ය අරමුදලට සියයට පනහක්, අධ්‍යාපන සංවර්ධන අරමුදලට සියයට තිහක් සහ පළාත් සභා අරමුදලට සියයට විස්සක් වශයෙන් ගෙවිය යුතු ය.

(3) උතුරු මැද පළාත් ලොතරැයියක යම් ත්‍යාග මුදලක් කිසිම තැනැත්තකු විසින් දිනාගෙන නොමැති අවස්ථාවක මේ ප්‍රඥප්තියේ කුමක් සඳහන් ව ඇත ද ඒ ත්‍යාග මුදල ත්‍යාග සංචිත ගිණුමකට බැර කරනු ලැබිය යුතු අතර, ඒ ගිණුමෙහි එකතුවන මුදල් ප්‍රමාණය ඉන් පසුව පැවැත්වෙන උතුරු මැද පළාත් ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් රීති සෑදිය යුතු බව

20. (1) අමාත්‍යවරයා විසින්, මේ ප්‍රඥප්තියෙන් රීති සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව මෙහි පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් රීති සෑදිය යුතු ය.

(අ) යම් උතුරු මැද පළාත් ලොතරැයියක ටිකට් පත් විකිණනු ලැබිය යුතු මිල ;

(ආ) සෑම උතුරු මැද පළාත් ලොතරැයි ටිකට් පතක ම සඳහන් කළ යුතු විස්තර ;

(ඇ) එවැනි සෑම උතුරු මැද පළාත් ලොතරැයියක ම ටිකට් පත් විකිණිය යුතු හෝ විකිණීම සඳහා ඉදිරිපත් කළ යුතු ආකාරය ;

(ඈ) උතුරු මැද පළාත් ලොතරැයි ටිකට් පත් විකිණීම සඳහා අනුයෝජිතයන් සේවයේ යොදවා ගැනීම හා ඒ අනුයෝජිතයන්ට ගෙවිය යුතු ගෙවීම හා කොමිස් මුදල් ;

(ඉ) එවැනි සෑම උතුරු මැද පළාත් ලොතරැයියක ම ත්‍යාග දිනූ එක් එක් ටිකට්පතේ අංකය සහ ඒ ටිකට් පතට හිමිකම් ඇති තැනැත්තාගේ නම හා ලිපිනය ප්‍රසිද්ධ කිරීම ; සහ

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ රීති සෑදිය යුතු යයි නියමිතව ඇත්තේ වෙනත් කවර කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා සාදන ලද සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එසේ පත් කිරීමෙන් පසු ගැසට් පත්‍රයෙහි සඳහන් දින සිට හෝ එහි සඳහන් ඉදිරි දිනයක සිට බලාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා සාදන සෑම රීතියක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත එය අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය. එසේ පළාත් සභාව අනුමත කිරීමෙන් හෝ සංශෝධන සහිතව අනුමත කිරීමෙන් හෝ පරිච්ඡින්න කිරීමෙන් පසු ඒ බවද ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, සංශෝධනය කිරීමකදී හෝ පරිච්ඡින්න කිරීමකදී රීති යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයකට අගතියකින් තොරව සංශෝධනය වීම හෝ පරිච්ඡින්න වීම බලපැවැත්විය යුතු ය.

## IV වන කොටස

### ලොතරැයි පැවැත්වීම

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව

21. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

22. මණ්ඩලයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ලොතරැයි ආඥාපනත උතුරු මැද පළාත් ලොතරැයිවලට අදාළ නොවිය යුතු බව

23. (1) (45 වන අධිකාරය වූ) ලොතරැයි ආඥාපනතේ විධිවිධාන සහ 1963 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ විධිවිධාන මේ ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලබන හෝ පැවැත්වීමට කටයුතු පිළියෙල කරනු ලබන ලොතරැයියකට සහ ඒ ලොතරැයියක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) (අ) උතුරු මැද පළාත් ලොතරැයියක් පැවැත්වීම හෝ පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම ;

(ආ) උතුරු මැද පළාත් ලොතරැයියක ටිකට්පත් ඇදීම ;

(ඇ) උතුරු මැද පළාත් ලොතරැයියක් ටිකට්පතක් මිල දී ගැනීම හෝ විකිණීම ;

(ඈ) උතුරු මැද පළාත් ලොතරැයියක් පැවැත්වීමෙහි ලා සහාය වීම ; හෝ

(ඉ) උතුරු මැද පළාත් ලොතරැයියක් පැවැත්වීම සඳහා යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීම.

(45 වන අධිකාර වූ) ලොතරැයි ආඥාපනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමක් නොවන බවත් උතුරු මැද පළාත් ලොතරැයියක් සම්බන්ධයෙන් එකී ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට මණ්ඩලය යටත් නොවන බවත් සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

24. (1) යම් අධිකරණයක් ඉදිරියෙහි මණ්ඩලය විසින් හෝ මණ්ඩලය හෝ මණ්ඩලයට විරුද්ධව හෝ ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අය කර ගන්නා ලද ගාස්තු කිසිවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම් එකී වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කර ගන්නා ලද්දේ නම් මිස මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

## V වන කොටස

### වැරදි සහ දඬුවම්

අරමුදල පවත්වාගෙන යාමේ නොහැකියාවක් ඇති වුවහොත්

25. මේ ප්‍රඥප්තිය යටතේ අරමුදල පවත්වාගෙන යාමේ යම් නොහැකියාවක් ඇති වුවහොත්, ප්‍රධාන අමාත්‍යවරයා විසින් පහත සඳහන් තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ පන්තියේ නිලධරයෙක් ;

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ පළමු පන්තියේ නිලධරයෙක් ; සහ

(ඇ) අවුරුදු පහකට වැඩි වෘත්තිය අත්දැකීම් සහිත ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙක්.

ප්‍රධාන අමාත්‍යවරයා විසින්, එම කමිටුවේ නිරීක්ෂණ ලැබුණු පසුව එම නිරීක්ෂණ ද පදනම්කොට ගෙන අරමුදලේ වත්කම් සහ බැරකම් උතුරු මැද පළාත් සභාවට මාරු කළ යුතු ය.

26. (අ) යම් උතුරු මැද පළාත් ලොතරැයියක කාර්යය සඳහා වන යම් ටිකට් පතක් ඒ ටිකට් පත මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති මගින් නිශ්චිත කරන ලද මිල ඉක්මවන යම් මිලකට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන ; හෝ

වැරදි

(ආ) එවැනි යම් ලොතරැයියක කාර්යය සඳහා වූ යම් ටිකට්පතක් කූට ලෙස සකස් කරන හෝ වෙනස් කරන ; හෝ

(ඇ) කූට ලෙස සකස් කරන ලද හෝ වෙනස් කරන ලද ටිකට් පතක් බව දන දනම උතුරු මැද පළාත් ලොතරැයියක කාර්යය සඳහා යම් ටිකට් පතක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට වූ බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි -

අර්ථ නිරූපණය

''උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල'' යන්නෙන් 2003 අංක 5 දරන උතුරු මැද පළාත් සභා අධ්‍යාපන සංවර්ධන අරමුදල් ප්‍රඥප්තිය මගින් පිහිටුවන ලද උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදල අදහස් වේ.

''අමාත්‍යවරයා'' යන්නෙන් උතුරු මැද පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

''ප්‍රධාන අමාත්‍ය අරමුදල'' යන්නෙන් 1990 අංක 16 දරන උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ප්‍රඥප්තිය මගින් පිහිටුවන ලද ප්‍රධාන අමාත්‍ය අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදල අදහස් වේ.

''පළාත් සභා අරමුදල'' යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති උතුරු මැද පළාත් අරමුදල අදහස් වේ.

28. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

04 - 345

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.